# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 1983 අංක 40 දරන අද්මිරාල්ති අධිකරණ බලය පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ඔක්තෝබර් මස 14 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ: ශත 90 යි | තැපැල් ගාස්තුව: ශත 50 යි

# 1983 අංක 40 දරන අද්මිරාල්ති අධිකරණ බලය පනත

[සහතිකය සටහන් කළේ 1983 ඔක්තෝබර් මස 12වන දින.]

එල්. ඩී.—ඕ. 46/78

අද්මිරාල්ති අධිකරණ බලය, නැව් සම්බන්ධ නඩු කටයුතු සහ නැව් සහ වෙනත් දේපළ ගිර භාරයට ගැනීම සම්බන්ධයෙන් වූ නීතිය සංශෝධනය කිරීම සහ ඒකාබද්ධ කිරීම සඳහා සහ ඊට ආනුෂංගික සියලු කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත 1983 අංක 40 දරන අද්මිරාල්ති අධිකරණ බලය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයකින් නියම කරනු ලබන යම් (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් හඳුන්වනු ලබන) දිනයක දී ක්‍රියාත්මක විය යුතු ය. ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

2. (1) වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන්ව ඇත ද එය නොතකා, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයෙහි අද්මිරාල්ති අධිකරණ බලය පහත දැක්වෙන පරිදි විය යුතු ය ; එනම්, පහත දැක්වෙන යම් ප්‍රශ්නයක් හෝ හිමිකම් පෑමක් විභාගකොට විනිශ්චය කිරීමට අධිකරණ බලය තිබිය යුතු ය :— ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ අද්මිරාල්ති අධිකරණ බලය.

(අ) නැවක සන්තකය හෝ අයිතිය සඳහා වූ හෝ එහි යම් කොටසක අයිතිය සඳහා වූ යම් හිමිකම් පෑමක් ;

(ආ) නැවක සන්තකය, එය සේවයෙහි යෙදවීම හෝ එහි ඉපයීම සම්බන්ධයෙන් එහි හවුල් අයිතිකරුවන් අතර පැන නගින යම් ප්‍රශ්නයක් ;

(ඇ) නැවක උකසක් හෝ ඍණ භාරයක් හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් පෑමක් ;

(ඈ) නැවකට සිදු වූ හානියක් සම්බන්ධයෙන් වූ යම් හිමිකම් පෑමක් ;

(ඉ) නැවකින් සිදු වූ හානියක් සඳහා වූ යම් හිමිකම් පෑමක් ;

(ඊ) (i) නැවක යම් දෝෂයක් හෝ එහි ආම්පන්න හෝ උපකරණවල දෝෂයක් නිසා ; හෝ

(ii) නැවක් ජලතරණය කරවීමේ දී හෝ එයි කළමනාකරණයේ දී හෝ එයට බඩු පැටවීමේ දී, එයින් බඩු ගෙන යාමේ දී හෝ එයින් බඩු ගොඩ බෑමේ දී හෝ නැවට තැනැත්තන් ඇතුළු කිරීමේ දී, එයින් තැනැත්තන් ප්‍රවාහනය කිරීමේ දී හෝ එයින් තැනැත්තන් ගොඩ බැස්සවීමේ දී කරන ලද ක්‍රියාවක්, නොසලකා හැරීමක් හෝ පැහැර හැරීමක් වන්නා වූ ද නැවක අයිතිකරුවන්, කුලියට ගන්නන් හෝ නැවක සන්තකය දරන හෝ එය පාලනය කරන තැනැත්තන් හෝ නෞකාධිපති හෝ එහි නාවියන් විසින් හෝ නැවෙහි අයිතිකරු, කුලියට ගත් තැනැත්තා හෝ නැවෙහි සන්තකය දරන හෝ එය පාලනය කරන තැනැත්තා වගකීම භාර ගන්නේ යම් තැනැත්තකුගේ වැරදි ක්‍රියා, නොස

ලකා හැරීම් හෝ පැහැර හැරීම පිළිබඳව ද ඒ තැනැත්තා විසින් හෝ කරන ලද යම් වැරදි ක්‍රියාවක් නොසලකා හැරීමක් හෝ පැහැර හැරීමක් නිසා සිදුවූ ජීවිත හානියක් හෝ පෞද්ගලික හානියක් වෙනුවෙන් වූ හිමිකම් පෑමක් ;

(උ) නැවක ගෙන යනු ලැබූ බඩුවල නැතිවීමක් හෝ බඩුවලට සිදු වූ හානියක් හෝ සඳහා වූ යම් හිමිකම් පෑමක් ;

(ඌ) නැවක බඩු ගෙන යාමට හෝ නැවක් පාවිච්චි කිරීමට හෝ නැවක් කුලියට ගැනීමට අදාළ යම් ගිවිසුමකින් උද්ගත වූ යම් හිමිකම් පෑමක් ;

(එ) බේරා ගැනීමක ස්වභාවයේ යම් හිමිකම් පෑමක් ;

(ඒ) නැවක් ඇදගෙන යාමක ස්වභාවයේ වූ යම් හිමිකම් පෑමක් ;

(ඔ) නැවක් නියමු කිරීමක ස්වභාවයේ වූ යම් හිමිකම් පෑමක් ;

(ඕ) නැවක ක්‍රියාකාරිත්වය හෝ නඩත්තුව සඳහා—

(i) බඩු හෝ ද්‍රව්‍ය සැපයීම, හෝ

(ii) ලබාදුන් සේවයක්

සම්බන්ධයෙන් වූ යම් හිමිකම් පෑමක් ;

(ක) නැවක් සෑදීම, අලුත්වැඩියා කිරීම හෝ නැවක උපකරණ සම්බන්ධයෙන් හෝ තටාක ගාස්තු හෝ හිඟ මුදල් හෝ සම්බන්ධයෙන් වූ යම් හිමිකම් පෑමක් ;

(ග) වැටුප් සඳහා නෞකාධිපතිවරයකු විසින් හෝ නාවික මණ්ඩලයේ සාමාජිකයකු විසින් කරනු ලබන යම් හිමිකම් පෑමක් සහ තත් කාලයේ බලපවත්වන යම් නීතියක් යටතේ වැටුප් ලෙස ලබා ගත හැකි යම් මුදලක් හෝ දේපළක් සඳහා නෞකාධිපතිවරයකු විසින් හෝ නාවික මණ්ඩලයෙහි සාමාජිකයකු විසින් හෝ ඔහු වෙනුවෙන් කරනු ලබන යම් හිමිකම් පෑමක් ;

(ච) නැවක් පිළිබඳව කරන ලද වියදම් සම්බන්ධයෙන් නෞකාධිපතිවරයකු, නැව්කරුවකු, නැව් කුලියට ගන්නකු හෝ නියෝජිතයකු විසින් කරනු ලබන යම් හිමිකම් පෑමක් ;

(ජ) පොදු වන්දියක් හෝ ගෙවිය යුතු වන ක්‍රියාවක් හෝ පොදු වන්දියක් ගෙවිය යුතු යයි කියනු ලබන යම් ක්‍රියාවක් නිසා උද්ගත වූ යම් හිමිකම් පෑමක් ;

(ට) නැව් බැඳුම්කරයක් නිසා ඇතිවන යම් හිමිකම් පෑමක් ;

(ඩ) නැවක් රාජසන්තක කිරීම සඳහා හෝ නුසුදුසු බව ප්‍රකාශ කරනු ලැබීම සඳහා හෝ නැවක ගෙනයනු ලබන හෝ ගෙන යනු ලැබ ඇති හෝ ගෙන යනු ලැබීමට තැත් කරනු ලැබ ඇති භාණ්ඩ රාජසන්තක කිරීම සඳහා හෝ නුසුදුසු බව ප්‍රකාශ කරනු ලැබීම සඳහා හෝ නැවක් හෝ අල්ලා ගනු ලැබූ භාණ්ඩ ආපසු දීම සඳහා හෝ මුහුදේ

දී හෝ මුහුද තුළ හෝ මුහුදු වෙරළේ දී හෝ වෙනත් උදම් ජලයක දී හමුවුණු මුහුදු බත් කළ බඩු, පාවෙන නැව් බඩු, මුහුදු පතුළේ ඇති බඩු, අත්හැර දැමූ බඩු සඳහා හෝ වරද කරු කරනු ලැබූ මුහුදු කොල්ල කරුවන් සන්තකයේ තිබී හමුවුණු දේපළ ද සඳහා වූ හිමිකම් පෑමක්

ඇතුළුව නැව්වලට සම්බන්ධ වෙනත් යම් ලිඛිත නීතියකින් පැවරෙන වෙනත් යම් අධිකරණ බලයක්.

(2) (අ) (1) වන උපවගන්තියේ වූ කිසිවක් රේගු ආඥා පනතේ හෝ රේගු ආඥාපනතේ විධිවිධාන සමග කියවනු ලබන වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන යටතේ කරන ලද යම් ක්‍රියාවකින් හෝ දෙයකින් හෝ ඒ විධිවිධාන යටතේ වූ තබු කටයුත්තකින් උද්ගත වන යම් ප්‍රශ්නයක් හෝ හිමිකම් පෑමක් විභාග කර තීරණය කිරීමට මහාධිකරණය වෙත අධිකරණ බලය පැවරීමක් ලෙස කියවා තේරුම් නොගත යුතු ය.

(ආ) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 13 වන වගන්තියෙහි හෝ මේ වගන්තියේ (1) වන උපවගන්තියෙහි හෝ ඇතුලත් කිසිවක් මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් ප්‍රශ්නයක් හෝ හිමිකම් පෑමක් විභාග කර තීරණය කිරීමට වෙනත් යම් නීතියක් මගින් වෙනත් යම් අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් වෙත පවරනු ලැබූ යම් අධිකරණ බලය කට බලපාන ලෙස කියවා තේරුම් නොගත යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකරණයේ අධිකරණ බලයට, නැවට සම්බන්ධ පාර්ශ්වයන් අතර හිඟව තිබෙන හා බේරුම් නොකළ යම් ගිණුම් බේරුම් කිරීමේ හා නැව හෝ එයි යම් කොටසක් විකිණිය යුතු බවට විධාන කිරීමේ හා අධිකරණය සුදුසු යයි කල්පනා කරන වෙනත් ආඥාවක් කිරීමේ බලය ඇතුළත් වේ.

(4) (1) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ අධිකරණයේ අධිකරණ බලයට යම් නැවක් විසින් හෝ නැවකින් ශ්‍රී ලංකා මුහුදු තීරයේ යම් තෙල් හෝ අපද්‍රව්‍ය මුදා හැරීමේ, පිටවීමේ හෝ ඉවත දැමීමේ හේතුවෙන් 1981 අංක 59 දරන මුහුදු අපවිත්‍ර වීම වැළැක්වීමේ පනත යටතේ ඇති වූ බැඳීමක් සම්බන්ධ යම් හිමිකම් පෑමක් විභාග කොට තීරණය කිරීමේ අධිකරණ බලය ඇතුළත් වේ.

මේ උපවගන්තියෙහි "අපද්‍රව්‍ය" යන්නට 1981 අංක 59 දරන මුහුදු අපවිත්‍රවීම වැළැක්වීමේ පනතේ ඊට දී ඇති අර්ථය ම ඇත්තේ ය.

(5) (1) වන උපවගන්තියේ (එ) වන ඡේදයේ බේරා ගැනීමේ ස්වභාවයේ හිමිකම් පෑම් සම්බන්ධයෙන් කර ඇති සඳහනට, නැවකින් ජීවිත ගලවා ගැනීමේ දී හෝ නැව් බඩු, ආම්පන්න හෝ ඝුන්බුන් ආරක්ෂා කිරීමේ දී සපයන ලද සේවාවන් සඳහා වූ ද, නැවක් සම්බන්ධයෙන් තත්කාලයෙහි බලපවත්නා නීතිය කින් ඉදිරිපත් කිරීමට බලය පවරන ලද්දා වූ ද හිමිකම් පෑම් පිළිබඳ සඳහන් කිරීම් ඇතුළත් වේ.

(6) (1) වන, (2) වන, (3) වන හා (4) වන උපවගන්තිවල විධිවිධාන—

(අ) ශ්‍රී ලංකාවේ හෝ ඉන් පිටත හෝ යම් වරායක ලියා පදිංචි කරනු ලැබූ හා අයිතිකරුවන්ගේ පදිංචිය හෝ වාසය කොතැනක හෝ විය හැකි, සියලු නැව් සම්බන්ධයෙන් ;

(ආ) ගොඩබිමෙහි දී හමු වූ නැව්බඩු හෝ සුන්බුන් සම්බන්ධයෙන් වන විට නැව්බඩු හෝ සුන්බුන් බේරා ගැනීමේ හිමිකම් පෑම් ද ඇතුළුව කොතැනක හෝ උද්ගත වූ සියලු හිමිකම් පෑම් සම්බන්ධයෙන් ; හා

(ඇ) උකස් කිරීම් හා සාංඝාරවලට අදාළ වන තාක් දුරට ලියා පදිංචි කරන ලද හෝ නොකරන ලද හෝ වේවා නීතිමය හෝ සාධාරණාත්මක හෝ වේවා, විදේශීය නීති යටතේ ඇතිකරන ලද උකස් කිරීම් හා සාංඝාර ද ඇතුළුව සියලු උකස් කිරීම් හෝ සාංඝාරවලට

අදාළ විය යුතු ය :

එසේ වුවද, මේ උපවගන්තියේ සඳහන් කිසිවක් 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ යම් විධිවිධානයක් යටතේ මුදල් හෝ දේපළ අයකරගත හැකි නැතහොත් ආපසු ලබාගත හැකි අවස්ථා ව්‍යාප්ත කිරීමක් ලෙස සලකනු නොලැබිය යුතු ය.

අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමය.

3. (1) 4 වන වගන්තියට යටත්ව එකී අධිකරණයේ අද්මිරාල්ති අධිකරණ බලය ඇතුළත සියලු නඩුවල දී පුද්ගල නඩුවක් අධිකරණයෙහි පවරනු ලැබිය හැකි ය.

(2) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ හෝ (ඇ) ඡේදයේ හෝ (ඩ) ඡේදයේ සඳහන් යම් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් හෝ 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් යම් ප්‍රශ්නයක් සම්බන්ධයෙන් හෝ ඒ හිමිකම් පෑම හෝ ප්‍රශ්නය උද්ගත ව ඇත්තේ යම් නැවක් හෝ දේපළක් සම්බන්ධයෙන් ද ඒ නැවට හෝ දේපළට විරුද්ධව සියල්ලන්ම බැඳෙන නඩුවක් මහාධිකරණයෙහි පවරනු ලැබිය හැකි ය.

(3) හිමිකම්පාන යම් මුදලක් වෙනුවෙන් යම් නැවක් හෝ වෙනත් දේපළක් මත සමුද්‍රිය කෑප අයිතියක් හෝ වෙනත් සාංඝාරයක් ඇති යම් අවස්ථාවක දී ඒ නැවට හෝ දේපළට විරුද්ධව සියල්ලන්ම බැඳෙන නඩුවක් අධිකරණයෙහි පවරනු ලැබිය හැකි ය.

(4) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සිට (ට) ඡේදය දක්වා සඳහන් එවැනි යම් හිමිකම් පෑමක දී—

(අ) නැවක් සම්බන්ධයෙන් හිමිකම් පෑම උද්ගතවන; හා

(ආ) පුද්ගල නඩුවක දී හිමිකම් පෑමට යටත්වන තැනැත්තා ("අදාළ තැනැත්තා") නඩු නිමිත්ත පැන නැගි අවස්ථාවේ නැවේ අයිතිකරු හෝ නැව කුලියට ගත් තැනැත්තා හෝ නැව සන්තකව සිටි තැනැත්තා හෝ පාලනය කළ තැනැත්තා වූ

අවස්ථාවක, (හිමිකම් පෑමෙන් ඒ නැව පිළිබඳ සමුද්‍රිය කැප අයිති යක් උද්ගත වුවද නොවුවද),

(i) නඩුව පවරනු ලබන අවස්ථාවෙහි අදාළ තැනැත්තා නැවේ සියලු කොටස් සම්බන්ධයෙන් අර්ථලාභී අයිතිකරු හෝ එය අධිකාර පත්‍රයක් යටතේ කුලියට ගෙන පවරාගත් තැනැත්තා වේ නම් ඒ නැවට ; හෝ

(ii) නඩුව පවරනු ලබන අවස්ථාවෙහි අදාළ තැනැත්තා වෙනත් යම් නැවක සියලු කොටස් සම්බන්ධයෙන් අර්ථලාභී අයිතිකරු වේ නම්, ඒ නැවට

විරුද්ධව සියල්ලන්ම බැඳෙන නඩුවක් අධිකරණයෙහි පවරනු ලැබිය හැකි ය.

(5) ස්වකීය අද්මිරල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී අධිකරණය විසින් යම් නැවක් හෝ වෙනත් දේපළක් විකිණීමට ආඥා කරන අවස්ථාවක දී ඒ විකිණීමෙන් ලැබෙන මුදලේ හිමිකම සම්බන්ධයෙන් උද්ගත වන යම් ප්‍රශ්නයක් විභාග කොට නිශ්චය කිරීමට අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(6) (4) වන උපවගන්තියේ කාර්ය සඳහා යම් පුද්ගල නඩුවක දී කර ඇති හිමිකම් පෑමක් පිළිබඳව යම් තැනැත්තකු වග කිවයුතුද යන්න නිශ්චය කිරීමේ දී ඔහුට ශ්‍රී ලංකාව ඇතුළත සාමාන්‍ය පදිංචිය හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇති බවට පූර්ව නිගමනය කළ යුතු ය.

(7) 2 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ සිට (ට) ඡේදය දක්වා වූ ඡේදවල සඳහන් කර ඇත්තා වූ ආකාරයේ යම් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් එකී හිමිකම් පෑම ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා ගෙන එන ලද සියල්ලන්ම බැඳෙන නඩුවක දී නැවට රිට් ආඥාවක් බාර දී ඇති හෝ නැව සිරභාරයට ගෙන ඇති හෝ අවස්ථාවක දී ඒ හිමිකම් පෑම ක්‍රියාත්මක කරවා ගැනීම සඳහා ඉදිරිපත් කර ඇති ඒ නඩුවේ දීම හෝ වෙනත් යම් සියල්ලන්ම බැඳෙන නඩුවක දී වෙනත් නැවකට රිට් ආඥාවක් බාර දීම හෝ ඒ නැව සිරභාරයට ගැනීම හෝ නොකළ යුතු ය. එහෙත් මේ වගන්තියේ සඳහන් කිසිවකින් එවැනි යම් එක් හිමිකම් පෑමක් සම්බන්ධයෙන් එක නැවකට වඩා වැඩි සංඛ්‍යාවක් නම් කරමින් රිට් ආඥාවක් නිකුත් කිරීම හෝ එක් එක් රිට් ආඥාවෙන් වෙනස් වූ නැවක් නම් කරන රිට් ආඥා දෙකක් හෝ ඊට වැඩි ගණනක් නිකුත් කිරීම වලක්වනු ලැබෙතැයි තේරුම් නොගත යුතු ය.

4. (1) මේ වගන්තිය අදාළ වන්නා වූ හිමිකම් පෑමක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුද්ගල නඩුවක්— ඝට්ටනය වීම පිළිබඳ සහ වෙනත් නඩුවල දී පුද්ගල නඩු පැවරීමට අදාළ අධිකරණ බලය.

(අ) විත්තිකරුගේ සාමාන්‍ය පදිංචිය හෝ ව්‍යාපාරික ස්ථානයක් ශ්‍රී ලංකාව ඇතුළත වේ නම් ; හෝ

(ආ) නඩු නිමිත්ත පැන නැගුනේ ශ්‍රී ලංකාවේ දේශිය ජල තීරය ඇතුළත හෝ ශ්‍රී ලංකාවේ වරායක සීමාවන් ඇතුළත වේ නම් ; හෝ

(ඇ) එකම සිද්ධියක් නිසා හෝ සිද්ධි ගණනාවක් නිසා පැන නැගුණු නඩුවක් අධිකරණය තුළ පැවැත්වෙමින් තිබේ නම් හෝ අධිකරණය විසින් විභාග කොට නිශ්චය කර තිබේ නම්

මිස, අධිකරණය විසින් භාර නොගත යුතු ය .

මේ උපවගන්තියේ—

"ගාස්තු" යන්නෙන් ආලෝක ගාස්තු, ප්‍රාදේශීය ආලෝක ගාස්තු සහ ප්‍රදීපාගාර, බෝයාව හෝ සංඥා ප්‍රදීප සම්බන්ධයෙන් වූ වෙනත් ගාස්තු සහ නියමුසේවා සම්බන්ධයෙන් වූ ගාස්තු හැරුණු විට අනෙකුත් ගාස්තු අදහස් වේ.

"වරාය" යන්නෙන් යම් වරායක්, නැව්තොටක්, ගංගාවක්, ගංමෝයක්, තොටුපලක්, නැව් තටාකයක්, ඇලක් හෝ තත් කාලයේ බලපවත්නා යම් නීතියක් මගින් හෝ නීතියක් යටතේ යම් ස්ථානයකට ඇතුළු වන්නා වූ හෝ එහි ඇති පහසුකම් ලබා ගන්නා වූ නැව්වලින් ගාස්තු අය කිරීමට යම් පුද්ගලයකු හෝ පුද්ගල මණ්ඩලයක් හෝ බලය ලබා ඇති තාක් කල් එවැනි වෙනත් ස්ථාන අදහස් කෙරෙන අතර, "වරායක සීමාවන්" යන්නෙන් ප්‍රස්තුත නීතිය මගින් හෝ නීතිය යටතේ හෝ අවස්ථාවෝචිත පරිදි, අදාළ ව්‍යවහාරය මගින් හෝ නියම කරන ලද එහි සීමාවන් අදහස් වේ;

"දේශීය ජලතීරය" යන්නට ශ්‍රී ලංකාවේ දේශීය මුහුද සහ ඓතිහාසික ජලතීරය ඇතුළත් වේ.

(2) පැමිණිලිකරු විසින් එකම සිද්ධියක් හෝ සිද්ධි ගණනාවක් සම්බන්ධයෙන් එකම විත්තිකරුට එරෙහිව ශ්‍රී ලංකාවෙන් පිටත අධිකරණයක කලින් පවරන ලද නඩුවක් අවසාන කොට හෝ වෙනත් ආකාරයකින් නිමාවට පත්වී ඇත්නම් මිස මේ වගන්තිය අදාළ වන හිමිකම් පෑමක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුද්ගල නඩුවක් අධිකරණය විසින් භාර නොගත යුතු ය.

(3) පුද්ගල නඩුවක දී අදාළවන ආකාරයටම (එකම සිද්ධියෙන් හෝ සිද්ධි ගණනාවක් පැන නගින්නා වූ හරස් ඉල්ලීමක් නොවන) හරස් ඉල්ලීමකට මේ වගන්තියේ ඉහතින්ම වූ විධිවිධාන අදාල විය යුතු ය. මේ කාර්යය සඳහා පැමිණිලිකරු සහ විත්තිකරු පිළිබඳව වූ සෑම සඳහනක්ම පිළිවෙලින් හරස් ඉල්ලීමේ පැමිණිලිකරු සහ හරස් ඉල්ලීමේ විත්තිකරු සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස තේරුම් ගත යුතු ය.

(4) නඩුවේ විත්තිකරු අධිකරණයේ අධිකරණ බලයට යටත් වුවහොත් හෝ ඒ යටත්වීමට එකඟ වී ඇතොත් මේ වගන්තියේ ඉහතින් ම වූ විධිවිධාන යම් නඩුවකට හෝ හරස් ඉල්ලීමකට අදාළ නොවිය යුතු ය.

(5) (2) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මේ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සිට (ඇ) දක්වා වූ ඡේදවල දැක්වෙන කොන්දේසිවලින් කිසිවක් සපුරා ඇති අවස්ථාවක මේ

වගන්තිය අදාළ වන්නා වූ හිමිකම් පෑමක් ක්‍රියාත්මක කිරීම සඳහා වූ පුද්ගල නඩුවක් බාර ගැනීමට අධිකරණයට අධිකරණ බලය තිබිය යුතු ය.

(6) (අ) නැව් අතර ඝට්ටනයක් ; හෝ

(ආ) නැව් දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් එකක් හෝ ඊට වැඩි ගණනක් ඇති අවස්ථාවක උපක්‍රමයක් ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කිරීම පැහැර හැරීම ; හෝ

(ඇ) නැව් දෙකකින් හෝ ඊට වැඩි ගණනකින් එකක් හෝ ඊට වැඩි ගණනක් මගින් ඝට්ටන නියෝග නොපිළිපැදීම

නිසා උද්ගත වන හානි, ජීවිත හානි හෝ පෞද්ගලික පීඩා සඳහා වූ යම් හිමිකම් පෑමකට මේ වගන්තිය අදාළ වේ.

5. ශ්‍රී ලංකා නැවක් නොවන්නා වූ නැවක නෞකාධිපති හෝ නාවික මණ්ඩලයේ සාමාජිකයකු විසින් වැටුප් සඳහා පවරනු ලබන නඩුවක් භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීමට අධිකරණයට ඇති බලය සීමා කිරීමක් වශයෙන් මෙම පනතේ කිසිවක් තේරුම් නොගත යුතු ය. වැටුප්.

6. රයින් නාවුක සම්මුතිය යටතේ එම සම්මුතියේ විධිවිධාන වලට අනුව තීරණය කරනු ලැබිය යුතු වූ ද, ඒ යටතේ ඇතුළත් වන්නා වූ ද හිමිකම් පෑමක් හෝ ප්‍රශ්නයක් බව ආරක්ෂක කටයුතු විෂයය භාර අමාත්‍යවරයා විසින් සහතික කරනු ලබන හිමිකම් පෑමක් හෝ ප්‍රශ්නයක් තීරණය කිරීමට අධිකරණයට අධිකරණ බලය නොමැති වන අතර, එවැනි හිමිකම් පෑමක් බලාත්මක කිරීම සඳහා එවැනි අධිකරණයක ආරම්භ කරනු ලබන නඩු කටයුත්තක් නිෂ්ප්‍රභ කළ යුතු ය. රයින් නාවුක සම්මුතියට ඇතුළත් වන අවස්ථා සම්බන්ධයෙන් අධිකරණ බලය ක්‍රියාත්මක නොකළ යුතු බව.

7. (1) මේ පනත යටතේ සියල්ලන්ම බැඳෙන නඩුවක් පවරනු ලැබ ඇති වූ ද, පැමිණිලිකරුගේ හිමිකම් පෑම ඉටු කරනු ලැබීමට පෙර අධිකරණයේ අධිකරණ බල සීමාවෙන් එම නඩුවට අදාළ යාත්‍රාව හෝ දේපළ ඉවත් කරගනු ලබන බවට විනිශ්චයකාරවරයා සෑහීමට පත්වන්නා වූ ද අවස්ථාවක, ඒ යාත්‍රාව හෝ දේපළ සිර භාරයට ගෙන රඳවා තබා ගැනීම සඳහා මෙම පනත යටතේ සාදනු ලබන රීති අනුව ඒ විනිශ්චයකාරවරයා විසින් වරෙන්තුවක් නිකුත් කිරීම නිත්‍යානුකූල වන්නේ ය : නැවක් සිරභාරයට ගැනීම නියෝග කිරීම සඳහා මහාධිකරණයට ඇති බලය.

එසේ වුවද, ඒ නඩුවේ පෙනී සිටීමක් ඇතුළත් කරනු ලැබූ විත්තිකරු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්—

(i) ඒ නඩුවෙන් හිමිකම් පානු ලැබූ මුදල හෝ ඒ නඩුවට අදාළ යාත්‍රාවේ හෝ දේපළෙහි මිළකළ වටිනාකමට සමාන මුදලක් අධිකරණයට ගෙවීම ; හෝ

(ii) ඒ මුදල ගෙවීම සඳහා නඩුවේ පැමිණිලිකරු සෑහීමට පත්වන අයුරු ඇපයක්, සහතිකයක් හෝ වෙනත් ඇපකරයක් දීම

කරනු ලබන්නේ නම්, මේ උපවගන්තිය යටතේ වරෙන්තුවක් නිකුත් කරනු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් අනුව යම් යාත්‍රාවක් හෝ දේපළක් සිරභාරයට ගෙන රඳවා තබාගෙන ඇති අවස්ථාවක, ඒ යාත්‍රාවට හෝ දේපළවලට අදාළ නඩුව සම්බන්ධයෙන් පෙනී සිටීමක් ඇතුළත් කරනු ලැබූ විත්තිකරු හෝ වෙනත් යම් තැනැත්තකු විසින්—

(අ) ඒ නඩුව සම්බන්ධයෙන් හිමිකම් පානු ලැබූ මුදල හෝ රඳවා ගනු ලැබූ යාත්‍රාවේ හෝ දේපළෙහි මිල කළ වටිනාකමට සමාන මුදලක් අධිකරණයට ගෙවීම ; හෝ

(ආ) ඒ මුදල ගෙවීම සඳහා නඩුවේ පැමිණිලිකරු සෑහීමට පත්වන අයුරු ඇපයක්, ඇප සහතිකයක් හෝ වෙනත් ඇපකරයක් දීම—

කරනු ලබන්නේ නම්, ඒ විත්තිකරු හෝ අනෙක් තැනැත්තා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම් පත්‍රයක් මත, විනිශ්චයකාරවරයා විසින් ඒ යාත්‍රාව හෝ දේපළ නිදහස් කිරීමේ ආඥාවක් කරනු ලැබිය හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද වරෙන්තුවක් අනුව සිරභාරයට ගනු ලැබූ යම් දේපළක් ඉක්මණින් දිරාපත් වීමට භාජන වන අවස්ථාවක, මාෂල්වරයා විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමක් මත, නඩුව තීරණය කරනු ලබන තුරු, එම දේපළ විකුණා ඒ විකිණීමෙන් ලත් මුදල අධිකරණයේ තැන්පත් කරන මෙන් අධිකරණය විසින් විධාන කළ හැකි ය.

(4) විනිශ්චයකාරවරයා විසින්, නඩුවේ සියලුම අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන, (1) වන උපවගන්තිය හෝ (2) වන උපවගන්තිය යටතේ අණකරන ලද යම් ඇපයක, ඇප සහතිකයක හෝ ඇපකරයක මුදල අඩු කිරීම හෝ වැඩි කිරීම කළ හැකි ය.

නඩු ගාස්තු, අය කිරීම් යනාදිය.

8. (1) අධිකරණය විසින් නඩු ගාස්තු, අයකිරීම්, වියදම් සහ ගාස්තු තීරණය කළ හැකි ය.

(2) නඩු ගාස්තු තීරණය කරනු ලැබූ විට, 11 (3) වන වගන්තිය යටතේ අදාළ කරනු ලබන අනුප්‍රමාණ අනුව තක්සේරු කරන ලද පරිදි ගෙවිය යුතු ය :

එසේ වුවද, අධිකරණය විසින් යෝග්‍ය යයි කල්පනා කරනු ලබන්නේ නම්, යම් විෂයයක් යටතේ දිය හැකි නඩු ගාස්තු නියම කිරීම හෝ වෙනස් කිරීම කළ හැකි ය.

(3) අය කිරීම්, වියදම් හා ගාස්තු තීරණය කරනු ලැබූ විට, තත්කාලීනව බලාත්මක වන්නා වූ අධිකරණයේ රීති මගින් නියමිත පරිමාණ අනුව හෝ එවැනි රීති නොමැති අවස්ථාවක අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි ගෙවිය යුතු ය.

9. (1) මහාධිකරණයේ අද්මිරල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී, එම මහාධිකරණයට සහායවීමේ කාර්ය සඳහා— මාෂල්වරයා සහ නියෝජ්‍ය මාෂල්වරයා.

(අ) මාෂල්වරයකු විය යුතු අතර, ඔහු 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 3 වන වගන්තිය යටතේ පත් කරන ලද වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා විය යුතු ය ; තව ද

(ආ) නියෝජ්‍ය මාෂල්වරයකු විය යුතු අතර, ඔහු ඒ පනත් යටතේ පත් කරන ලද නියෝජ්‍ය වෙළෙඳ නැව් අධ්‍යක්ෂවරයා විය යුතු ය.

(2) මේ පනතින් මාෂල්වරයාට හෝ නියෝජ්‍ය මාෂල්වරයාට නියම කර ඇති කාර්යයන් ඉටු කිරීමේ දී, ඔවුන්, අද්මිරල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කරන මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු විසින් කරනු ලබන ආඥාවලට හා විධානවලට යටත් විය යුතු ය.

10. මේ පනත යටතේ වූ නඩුවක දී හෝ වෙනත් නඩු කටයුත්තකදී ඉදිරිපත් කරනු ලබන උත්තරවාදවල, ඉල්ලීම්වල, ලේඛනවල, 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ සලසා ඇති විධිවිධානවලට අනුකූලව මුද්දර යොදා තිබිය යුතු ය. මුද්දර.

11. (1) නියමිත දිනයට ඉහතින් ම වූ දිනයෙහි කොළඹ මහාධිකරණයෙහි විභාගයට භාජනව පැවති සියලු ඉල්ලුම්පත්, නඩු, පරීක්ෂණ, නඩු විභාග හෝ වෙනත් නඩු කටයුතු අද්මිරල්ති අධිකරණ බලය කොළඹ දී ක්‍රියාත්මක කිරීම පිණිස පවත්වනු ලබන අධිකරණය වෙත භාර වෙන අතර, ඒවා හැකිතාක් දුරට මේ පනතේ විධිවිධානවලට අනුකූලව විභාග කරනු ලැබිය යුතු ය. අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහ අන්තර්කාලීන විධිවිධාන.

(2) නියමිත දිනයට පෙර බලාත්මකව පැවති නීතිය යටතේ පළ කරනු ලැබූ දැන්වීම්, කැඳවනු ලැබූ ටෙන්ඩර්, පවරන ලද බලතල හා අධිකාර, නියම කරන ලද ආකෘති පත්‍ර, කරන ලද තක්සේරු, ආඥාවන්, රීති සහ පත් කිරීම්, නිකුත් කරන ලද කොමිසම් හා විධාන, දෙන ලද අවසර, අනුමැති සහ එකහත්වයන් මේ පනත යටතේ හෝ මේ පනත යටතේ සාදන ලද රීති යටතේ පළ කරනු ලැබූ, කැඳවනු ලැබූ, පවරනු ලැබූ, නියම කරනු ලැබූ, නිකුත් කරනු ලැබූ, කරනු ලැබූ හෝ දෙනු ලැබූ හෝ ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ මහාධිකරණයෙහි බලය ක්‍රියාත්මක කිරීමේ දී එහි පරිචය හා ක්‍රියා පටිපාටිය විධිමත් කරන රීති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ සාදනු ලැබිය හැකි ය.

(4) මේ පනතේ විධිවිධාන කිසිවක් හෝ එහි ප්‍රතිඵලයක් වශයෙන් වූ යම් ඉවත් කිරීමක් හෝ නියමිත දිනයට පෙරාතුව උද්ගත වන කිසියම් නඩු නිමිත්තක් සම්බන්ධයෙන් වූ නඩු කටයුතුවලට බල නො පෑ යුතු ය.

ඇතැම් නඩුවල දී එංගලන්තයේ අද්මිරාල්ති අධිකරණ බලය දරන අධිකරණයක බලතල අධිකරණයට තිබිය යුතු බව.

12. මේ පනත යටතේ පවරන ලද යම් නඩු කටයුත්තක දී මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ රීතියක් හෝ මගින් නැතහොත් ඒවා යටතේ කිසිදු විධිවිධානයක් හෝ ප්‍රමාණවත් විධිවිධාන හෝ සලසා නොමැති යම් කාරණාවක් නැතහොත් කාර්ය පටිපාටිය පිළිබඳ ප්‍රශ්නයක් උද්ගත වූ අවස්ථාවක සමාන අවස්ථාවල දී එංගලන්තයේ අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කිරීම කරන අධිකරණයට කිරීමට බලය ඇති ආඥා ද, කිරීමට බලය ඇති විධානයන් ද ඒ ආඥා හා විධාන මේ පනත හෝ වෙනත් යම් ප්‍රඥප්තියක් හෝ රීතියක් හෝ මගින් නැතහොත් ඒවා යටතේ සාදන ලද විධිවිධාන කිසිවක් හා නොගැටෙන හෝ අනනුකූල නොවන හෝ නාක්දුරට සෑදීමේ හෝ කිරීමේ බලය අධිකරණයට තිබිය යුතු ය.

1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ ඇතැම් යෙදුම් තේරුම් ගැනීම.

13. මේ පනතේ උපලේඛනයේ 1 වන තීරයේ දක්වා ඇති 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ යම් විධිවිධානයක ඒ උපලේඛනයේ II වන තීරයේ අනුරූප සටහනේ සඳහන් යම් වචනයක් හෝ යෙදුමක් ගැන කර ඇති සඳහන් කිරීමක්, "අද්මිරාල්ති අධිකරණ බලය ක්‍රියාත්මක කරන, ශ්‍රී ලංකා මහාධිකරණයේ විනිශ්චයකාරවරයකු" ගැන කරන ලද සඳහන් කිරීමක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

අර්ථ නිරූපණය.

14. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"ගැටවන නියෝග" යන්නෙන් 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ 186 වන වගන්තිය යටතේ වූ නියෝග අදහස් වේ;

"අධිකරණය" යන්නෙන් ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය අදහස් වේ;

"බඩු" යන්නට ගමන් බඩු ඇතුළත් වේ;

"නෞකාධිපති" යන්නට, නැවක් සම්බන්ධයෙන් යෙදෙන විට, නැවක පාලනය හෝ භාරය තත් කාලයෙහි දරන (නියමුවා හැර) යම් තැනැත්තෙක් අදහස් වේ;

"නැව" යන්නට ජලතරණය සඳහා උපයෝගී කරගනු ලබන ඕනෑම වර්ගයක යාත්‍රාවක් ඇතුළත් වේ;

"රයින් ජලතරණ සම්මුතිය" යන්නෙන් යම් තදනන්තර සම්මුති මගින් සංශෝධිත, වර්ෂ එක්දහස් අටසිය හැට අටේ ඔක්තෝබර් මස හත් වන දින දරන සම්මුතිය අදහස් වේ.

උපලේඛනය (13 වන වගන්තිය)

| I වන තීරය | II වන තීරය |
| --- | --- |
| 1971 අංක 52 දරන වෙළෙඳ නැව් පනතේ විධිවිධානය | වචනය හෝ යෙදුම |
| 60 වන වගන්තිය | අධිකරණය |
| 62 වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 122 වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණය හෝ ලංකා අද්මිරාල්ති අධිකරණ ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ අද්මිරාල්ති අධිකරණ බලය ඇති දිසා අධිකරණයක් |
| 211 (4) වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් |
| 217 (2) වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් |
| 243 වන වගන්තිය | යටත් විජිත අද්මිරාල්ති අධිකරණය |
| 255 (2) වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 256 වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 258 වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 260 (3) (ආ) වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක් |
| 264 වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 275 (1) වන වගන්තිය | යටත් විජිත අද්මිරාල්ති අධිකරණය |
| 279 (2) වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණය |
| 293 (1) වන වගන්තිය | ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයෙක්. |